0823

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

# මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# மத்திய மாகாண கல்வித் திணைக்களம்
# DEPARTMENT OF EDUCATION - CENTRAL PROVINCE

අවසාන වාර පරීක්ෂණය - 2023 (2024)
ஆண்டிறுதிப் பரீட்சை - 2023 (2024)/ Final Term Test - 2023 (2024)

ශ්‍රේණිය / தரம் / Grade } 10 ශ්‍රේණිය

පුරවැසි අධ්‍යාපනය

කාලය / நேரம் / Time } පැය 3 යි

නම / பெயர் / Name } Gagana Wardhenakumbura

විභාග අංකය / சுட்டிலக்கம் / Index No. } 50 10-D

## I පත්‍රය

- සියලුම ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.
- නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.

01) ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍ය ක්‍රමයක බලයේ අවසාන හිමිකරු වන්නේ,

i. ජනාධිපති ය. ii. ජනතාව ය. iii. අධිකරණ ඇමති ය. iv. නීතිපති ය.

02) ඍජු ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය වර්තමානයේ ක්‍රියාත්මක කිරීම අපහසු වීමට ප්‍රධාන හේතුව වන්නේ,

i. බලය විමධ්‍යගත කර තිබීම. ii. රාජ්‍ය තුළ ජනගහනය අධික වීම.
iii. සර්වජන ඡන්ද බලය පැවතීම. iv. බලය බෙදාහැර තිබීම.

03) "ප්‍රජාතන්ත්‍රවාදය යනු සියලු දෙනාට ම අයිතිවාසිකම් හිමිවන පාලන ක්‍රමය යි." යනුවෙන් ඉදිරිපත් කළේ,

i. ඒබ්‍රහම් ලින්කන් ii. හැරල්ඩ් ලැස්කි ය. iii. සීලර් ය. iv. අයිවර් ජෙනිංග්ස් ය.

04) රටක සියල්ලන්ට ම ඉහළින් නීතිය පවතී. එමෙන්ම නීතිය ක්‍රියාත්මක වීමේ දී පාලකයන්ට මෙන්ම පාලිතයන්ට ද සමානව නීතිය ක්‍රියාත්මක විය යුතුය. මින් කියවෙන ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක තිබිය යුතු අංග ලක්ෂණය වන්නේ,

i. නීතියේ ආධිපත්‍යය ii. නිදහස් හා සාධාරණ මැතිවරණ පැවැත්වීම
iii. අධිකරණයේ ස්වාධීනත්වය iv. ආණ්ඩු පක්ෂයේ හා විරුද්ධ පක්ෂයක් පැවතීම

05) ලොව රටවල විවධ පක්ෂ ක්‍රම දක්නට ඇත. ඒ අතරින් බහු පක්ෂ ක්‍රමය දක්නට ලැබෙන රටවල් දෙකක් ඇතුළත් පිළිතුර වනුයේ,

i. චීනය හා කියුබාව ii. උතුරු කොරියාව හා රුසියාව
iii. ඉන්දියාව හා ශ්‍රී ලංකාව iv. එංගලන්තය හා ඇමරිකාව

06) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයට අයත් අංග ලක්ෂණයක් ලෙස පිළිගත නොහැකි කරුණ වන්නේ මින් කවරක්ද?

i. ආණ්ඩු පක්ෂයක් හා විරුද්ධ පක්ෂයක් පැවතීම ii. තරඟකාරී පක්ෂ ක්‍රමය පැවතීම
iii. නිදහස් හා සාධාරණ මැතිවරණ පැවැත්වීම iv. ඒක පක්ෂ ක්‍රමය පැවතීම

07) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් යටතේ රජ්‍යයේ පාලනය සිදු වන්නේ,

i. ආචාරධර්ම පද්ධතියකට අනුවය. ii. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුවය.
iii. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට අනුවය. iv. අණ පනත්වලට අනුවය.

08) මහාචාර්ය ගානර් විසින් ඉදිරිපත් කළ, ආකාරයට "රාජ්‍යයේ හෝ ජනතාවගේ කැමැත්ත ප්‍රතිපත්තිවලට හැරවීමත් ඒවා ක්‍රියාවට නැංවීමේ අරමුණින් මිනිසුන් එකට එක්වී පිහිටුවා ගත් සංවිධානය'' හඳුන්වන්නේ,

i. ආණ්ඩුව නමින් ය. ii. රාජ්‍ය නමින් ය. iii. ජාතික රාජ්‍ය නමින් ය. iv. පාර්ලිමේන්තුව නමින් ය.

09) ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක යහපත් පුරවැසියෙකු ලෙස ප්‍රගුණ කළ යුතු ගුණාංගයක් වන්නේ,

i. අන් අයගේ විවිධ මත නොසලකා හැරීම ii. විනය ගරුක බව.

iii. පොදු දේපළ රිසි සේ භාවිතා කිරීම. iv. ස්වකීය අවශ්‍යතා පිළිබඳව පමණක් සැලකිලිමත් වීම

10) රාජ්‍යයක මූලික ලක්ෂණ නිවැරදි ව දැක්වෙන් පිළිතුර වන්නේ,

i. භූමිය, ජනගහනය, ආණ්ඩුව, ස්වාධිපති බලය ii. භූමිය, ආණ්ඩුව, ස්වාධිපති බලය, පක්ෂ ක්‍රමය

iii. ජනාධිපති, අධිකරණය, ආණ්ඩුව, භූමිය iv. විධායකය, ව්‍යවස්ථාදායකය, අධිකරණය, ආණ්ඩුව

11) ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පුරවැසියෙකු විසින් සමාජය වෙත ඉටු කළ යුතු ප්‍රධාන යුතුකම් වර්ග දෙක වන්නේ,

i. සිවිල් හා දේශපාලන යුතුකම් ii. නිතිමය හා සදාචාරාත්මක යුතුකම් ය

iii. සංස්කෘතික හා ආගමික යුතුකම් iv. ආර්ථික හා සමාජීය යුතුකම්.

12) ප්‍රජාතන්ත්‍රවාදී ජන සමාජයක පාලන කටයුතු පවත්වාගෙන යාමේ ජනතාව සතු බලය හඳුන්වන්නේ,

i. ඡන්ද බලය යනුවෙනි. ii. උත්තරීතර බලය යනුවෙන් ය.

iii. ස්වාධිපති බලය යනුවෙනි. iv. පරමාධිපත්‍ය බලය යනුවෙන් ය.

13) කිසියම් රටක මධ්‍යම ආණ්ඩුව සතු ව්‍යවස්ථාදායක, විධායක හා අධිකරණ බලතල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ප්‍රාදේශීය ආණ්ඩු ඒකක වෙත පවරාදීම හඳුන්වනු ලබන්නේ කුමන නමකින්ද?

i. බලය විමධ්‍යගත කිරීම. ii. බලය මධ්‍යගත කිරීම.

iii. බලය බෙදාහැරීම. iv. බලය කේන්ද්‍රගත කිරීම.

14) මධ්‍යම ආණ්ඩුව සතු පරිපාලන බලතල ප්‍රාදේශීය පාලන ඒකක වෙත පවරාදීම යනු,

i. බලය නිශේධනය කිරීම යි. ii. බලය බෙදීමයි.

iii. බලය විමධ්‍යගත කිරීම යි. iv. බලය නියාමනය කිරීමයි.

15) සන්ධීය රාජ්‍යයක ප්‍රධාන ලක්ෂණයක් වන්නේ,

i. ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් දක්නට නොලැබීම.

ii. රජයේ බලය මධ්‍යම ආණ්ඩුව වටා කේන්ද්‍රගත වීම.

iii. උත්තර මන්ත්‍රී මණ්ඩලයක් ඇති නොකිරීම.

iv. නීති ක්‍රම දෙකක් පැවතිය හැකි වීම.

16) සන්ධීය ආණ්ඩුක්‍රමයක් පවතින රාජ්‍යයක් වන්නේ,

i. ශ්‍රී ලංකාව ii. ස්විට්සර්ලන්තය iii. මහා බ්‍රිතාන්‍ය iv. ප්‍රංශය

17) අනුරාධපුර හා පොළොන්නරු යුගවල දී ප්‍රාදේශීය පාලනය සඳහා විවිධ නිලතල පත් කිරීම තුළින් පැහැදිළි වන්නේ,

i. අතීතයේ සිට බලය බෙදාහැරීමක් දක්නට ඇති බවය.

ii. අතීතයේ සිට බලය විමධ්‍යගත කිරීම සිදු වී ඇති බවය.

iii. අතීතයේ සිට බලය දැඩි පාලනයකට යටත් කළ බවය.

iv. ඉහත පිළිතුරු කිසිවක් අදාළ නැත.

18) ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ඡන්ද කොට්ඨාශ බෙදා වෙන් කරනු ලබන්නේ,

i. රාජ්‍ය සේව කොමිෂන් සභාව විසිනි. ii. පළාත් සභා විසිනි

iii. පාර්ලිමේන්තු තේරීම් කාරක සභාව විසිනි. iv. සීමා නිර්ණය කොමිෂන් සභාව විසිනි

19) රාජ්‍යයේ කැමැත්ත හා මහජන අපේක්ෂා ක්‍රියාවට නංවන නියෝජිතයා ලෙස සැලකෙන්නේ,

i. ජනාධිපතිවරයාය. ii. කථානායකවරයාය. iii. අග්‍රාමාත්‍යවරයාය iv. ආණ්ඩුවය

20) යුරෝපයේ බිහි වූ ප්‍රථම ජාතික රාජ්‍ය දෙක ඇතුළත් පිළිතුර තෝරන්න

i. එංගලන්තය සහ ජර්මනිය ii. ස්පාඤ්ඤය හා ඉතාලිය

iii. ඕලන්දය හා පෘතුගාලය iv. එංගලන්තය හා ප්‍රංශය

21) ශ්‍රී ලංකාවේ වර්තමානයේ ක්‍රියාත්මක වන පලාත් පාලන ආයතනයක් වන්නේ,

i. ගම් සභාව  ii. ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය

iii. ග්‍රාමනිලධාරී කොට්ඨාශය  iv. මහ නගර සභාව

22) ලංකාවේ බහු සංස්කෘතික ජන සමාජය මුහුණ දුන් සංක්‍රමණයකට අදාළ වන්නේ,

i. භද්දකච්චානා ඇතුළු පිරිස පැමිණීම.  ii. කාලිංග මාඝ අල්ලා ගැනීම.

iii. සේන ගුත්තික අල්ලා ගැනීම.  iv. යුරෝපා ජාතීන්ගේ පැමිණීම.

23) බහු සංස්කෘතික ජන සමාජයක යහපත් පුරවැසියෙකු විසින් ප්‍රගුණ කළ යුතු ගුණාංගයක් වන්නේ,

i. අන්‍යමත අභිබවා යාම.  ii. අන්‍ය ආගම්වලට වෙනස් කොට සැලකීම.

iii. ගැටුම් ඇති නොවන පරිදි කටයුතු කිරීම.  iv. තම සමාජ පන්තිය පමණක් රැක ගැනීම.

24) බහු සංස්කෘතික ජන සමාජයක යහපාලනය ක්‍රියාත්මක වීමෙන් අත්වන වැදගත් ප්‍රත්ඵලයකි.

i. භාෂා කිහිපයක් භාවිතා කළ හැකි වීම.

ii. ආගම් කිහිපයක් ඇදහීමට පුළුවන් වීම.

iii. ආගමික හා සංස්කෘතික විවිධතා නොසලකා සහජීවනයෙන් කටයුතු කිරීමට හැකි වීම.

iv. විවිධ සංස්කෘතීන් පිළිබඳව අවබෝදයක් ලබා ගත හැකි වීම.

25) යහපත් පාලනයක මූලික ගුණාංගයක් පිළිතුරු අතරින් තෝරන්න.

i. අනවශ්‍ය ආකාරයෙන් දේශපාලන බලය පවුලක් වටා මධ්‍යගත වීම.

ii. රාජ්‍ය සේවය දේශපාලනීකරණය වීම.

iii. රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම කෙරෙහි ජනතා සහභාගීත්වය අවම කිරීම.

iv. දූෂනයෙන් වංචාවෙන් තොර රාජ්‍ය පාලනය

26) භාණ්ඩ නිෂ්පාදනය සඳහා වැඩිපුර යන්ත්‍ර සූත්‍ර යොදා ගැනීම

i. ශ්‍රම සූක්‍ෂම වේ.  ii. ප්‍රාග්ධන සූක්‍ෂම වේ.

iii. යාන්ත්‍රිකරණය වේ.  iv. ශ්‍රමාභිමානය වේ.

27) තිරිඟු නිෂ්පාදනය සඳහා යොදා ගන්නා පොහොර,

i. අන්තර් භාණ්ඩ සඳහා උදාහරණයකි.  ii. සුබෝපභෝගී භාණ්ඩ සඳහා උදාහරණයකි.

iii. පාරිභෝගික භාණ්ඩ සඳහා උදාහරණයකි.  iv. ප්‍රාග්ධන භාණ්ඩ සඳහා උදාහරණයකි.

28) නිෂ්පාදනයේ දී පිරිවැයක් දැරීමට සිදුවන හා පරිහරණයේදී මිලක් ගෙවීමට සිදුවන භාණ්ඩ,

i. පාරිභෝගික භාණ්ඩ නම් වේ.  ii. අන්තර් භාණ්ඩ නම් වේ.

iii. ප්‍රාග්ධන භාණ්ඩ නම් වේ.  iv. ආර්ථික භාණ්ඩ නම් වේ.

29) ආර්ථිකයක නිෂ්පාදනය කරන භාණ්ඩ හා සේවා යොදාගෙන මිනිස් අවශ්‍යතා හා වුවමනාවන් ඉටුකර ගැනීම,

i. නිෂ්පාදනය යි  ii. පරිභෝජනය යි.

iii. බෙදාහැරීම යි  iv. ව්‍යවසායකත්වය යි.

30) ආර්ථිකය සතු සම්පත් අනාගත පරම්පරාව සඳහා සුරක්ෂිත කරමින් වර්තමාන අවශ්‍යතා ඉටුකර ගැනීම

i. තිරසාර සංවර්ධනය වේ.  ii. ඵලදායිතාවය වේ.

iii. කාර්යක්‍ෂමතාව වේ.  iv. පරිභෝජනය වේ.

31) කිසියම් රටක් තම රටට අවශ්‍ය භාණ්ඩ හා සේවා විදේශ රටවලින් ලබා ගැනීම හඳුන්වන්නේ,

i. ආනයන ලෙසය.  ii. භාණ්ඩ හුවමාරුව ලෙසය.

iii. අපනයන ලෙසය.  iv. විදේශ වෙළදාම ලෙසය.

32) තම ආර්ථිකයට හා සමාජයට ගැලපෙන පරිසර හිතකාමී තාක්‍ෂණය,

i. නවීන තාක්‍ෂණය ලෙස හඳුන්ව යි.  ii. යෝග්‍ය තාක්‍ෂණය ලෙස හඳුන්ව යි.

iii. යාන්ත්‍රීකරණය ලෙස හඳුන්ව යි.  iv. නිර්මාණශීලීත්වය ලෙස හඳුන්ව යි.

33) පරිසරය සම්බන්ධයෙන් පුරවැසියෙකු සතු යුතුකමක් වන්නේ,

i. තම අභිමතය පරිදි සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගැනීම

ii. පරිසරයේ සම්පත් අරපිරිමැස්මෙන් භාවිතා කිරීම හා ආරක්ෂා කිරීම.

iii. සිය පාරිභොජන අවශ්‍යතා සඳහා බාධාවකින් තොරව සම්පත් අසීමිතව භාවිතා කිරීම.

iv. තම බුද්ධිය මෙහයවා සම්පත් උපක්‍රමශීලි ලෙස අවභාවිතා කිරීම.

34) රටක සංවර්ධනය සම්බන්ධයෙන් ගත්විට මෑත කාලීනව වැඩි වශයෙන් සාකච්ඡාවට බඳුන් වී ඇති ගෝලීය සංකල්පය කුමක්දැයි පහත පිළිතුරු අතරින් තෝරන්න.

i. තිරසර සංවර්ධනය    ii. පුද්ගල සංවර්ධනය    iii. සදාචාර සංවර්ධනය    iv. සමාජ සංවර්ධනය

35) BIMSTEC (බිම්ස්ටෙක්) සංවිධානයට අයත් රටවල් පහත පිළිතුරු අතරින් තෝරන්න.

i. ප්‍රංශය, බෙල්ජියම, බ්‍රිතාන්‍ය, ස්වීඩනය

ii. ඇමරිකා එක්සත් ජනපදය, කැනඩාව, මෙක්සිකෝව

iii. ඉතාලිය, ප්‍රංශය, ඇමරිකාව, ඉන්දියාව

iv. බංගලාදේශය, ඉන්දියාව, මියන්මාරය, ශ්‍රී ලංකාව

36) "අ" කොටසේ වගන්ති "ආ" කොටස සමඟ ගැළපූ විට නිවැරදි වන්නේ,

| (අ) | (ආ) |
|---|---|
| 01. ගෝලීයකරණය නිසා ලෝක ආර්ථිකය තුළ දක්නට ලැබෙන ලක්ෂණයකි | A මූලික අවශ්‍යතා තෘප්තකර ගැනීම |
| 02. තිරසාර සංවර්ධනයේ දී වඩාත් සැලකිය යුතු කරුණකි. | B බහු ජාතික සමාගම් බිහිකිරීම |
| 03. පරිවර්තන ආර්ථිකයක දැකිය හැකි ලක්ෂණයකි. | C පෞද්ගලික ව්‍යවසාය දිරිගැන්වීම |

i. ABC    ii. BAC    iii. CBA    iv. BCA

37) ජොහාන් ගැල්ටුං විසින් ඉදිරිපත් කළ ත්‍රිකෝණ අරගල ආකෘතියට අයත් නොවන සංකල්පය වන්නේ,

i. චර්යාව    ii. ආකල්ප    iii. සන්ධර්භය    iv. ජනවර්ගය

38) දෙපාර්ශවයටම ජය ජය විසඳුම කරා ළඟාවිය හැකි ගැටුම් විසඳීමේ ක්‍රමය හඳුන්වන්නේ,

i. කේවල් කිරීම ලෙසය.    ii. සාකච්ඡා ක්‍රමය ලෙසය.

iii. සහමන්ත්‍රණය ලෙසය.    iv. මැදිහත්කරණය ලෙසය.

39) ගැටුම් නිරාකරණය සඳහා සමථකරණය යොදාගත හැකි අවස්ථාවක් වන්නේ,

i. ස්ත්‍රී දූෂණ නඩු විසඳීම.    ii. මිනීමැරුම් නඩු විසඳීම.

iii. පවුල් ආරවුල් විසඳීම.    iv. ළමා අපචාර නඩු විසඳීම.

40) ගැටුම් නිරාකරණය සඳහා යොදා ගනු ලබන ක්‍රම අතරින් සාම්ප්‍රදායිකම ක්‍රමය වන්නේ,

i. විකල්ප ජනනය යි    ii. සහමන්ත්‍රණය යි    iii. බේරුම්කරණය යි    iv. විනිසීම යි.

## II පත්‍රය

0825

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. ඒ සඳහා කෙටි පිළිතුරු ලියන්න.
- පළමු ප්‍රශ්නයටත් තවත් ප්‍රශ්න හතරකටත් පිළිතුරු ලියන්න.

01) i. වර්තමානයේ සෘජු ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක නොවීමට බලපෑ සාධක ලියන්න.
ii. ප්‍රජාතන්ත්‍රවාදය විග්‍රහ කරන ප්‍රධාන දෘෂ්ඨිකෝණ 02 ලියන්න.
iii. තරඟකාරී පක්ෂ ක්‍රමයක යහපත් ලක්ෂණ දෙකක් ලියන්න.
iv. ආණ්ඩුවේ ප්‍රධාන ආයතන දෙකක් නම් කරන්න.
v. රාජ්‍යයකට පැවරෙන කාර්යයන් දෙකක් ලියන්න.
vi. ඒකීය ආණ්ඩුක්‍රම පවතින රාජ්‍යයන් දෙකක් ලියන්න.
vii. ජාතික රාජ්‍යයක ප්‍රධාන ලක්ෂණ 02 ලියන්න.
viii. ශ්‍රී ලංකාව බහු සංස්කෘතික ජන සමාජයක් වීමට බලපෑ ප්‍රධාන සාධක අතරින් දෙකක් ලියන්න.
ix. රටක සංවර්ධනයේ දී සලකා බැලිය යුතු ප්‍රධාන අංශ දෙකක් ලියන්න.
x. අන්තර්ජාතික ගැටුම් වර්ග කළ හැකි ප්‍රධාන ආකාර දෙක ලියන්න. (ල. 10 x 2 - 20)

02) i. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයේ ස්වරූප දෙක නම් කරන්න. (ල. 2)
ii. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක දක්නට ඇති අංග ලක්ෂණ 02 ක් ලියන්න. (ල. 3)
iii. ප්‍රජාතන්ත්‍රවාදී පාලනය සාර්ථක කර ගැනීම සඳහා විරුද්ධ පක්ෂයෙන් ඉටුවිය යුතු කාර්යයන් තුනක් ලියා ඉන් එකක් පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ල. 3 + 2 = 5)

03) i. නූතන රාජ්‍යයන්ගේ ප්‍රධාන ස්වරූප දෙක නම් කරන්න. (ල. 2)
ii. ව්‍යවස්ථාදායක මණ්ඩලයේ කාර්යයන් 03 ක් ලියන්න. (ල. 3)
iii. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් පවතින රටක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව කටයුතු කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන 03 ක් ලියා ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 3 + 2 = 5)

04) i. බලය විමධ්‍යගත කිරීම යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද? (ල. 2)
ii. ස්විට්සර්ලන්තය සන්ධීය රාජ්‍යයක් ලෙස බිහිවීමට බලපෑ හේතු 03 ලියන්න. (ල. 3)
iii. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් සාර්ථක වීමට අවශ්‍ය සාධක 03 ක් ලියා ඉන් එකක වැදගත්කම ශ්‍රී ලංකාව ඇසුරෙන් කෙටියෙන් පැහැදිලි කර ලියන්න. (ල. 3 + 2 = 5)

05) i. පළාත් සභාවක ආයතනික ව්‍යුහය තුළ දක්නට ඇති ඉහළම නිලතල දෙක නම් කරන්න. (ල. 2)
ii. පළාත් සභාවක බලතල දක්වා ඇති I, II, හා III වශයෙන් දක්වා ඇති ලැයිස්තු 03 අනුපිළිවෙලින් නම් කරන්න. (ල. 3)
iii. ශ්‍රී ලංකාවේ වර්තමාන පළාත් පාලන ආයතන 03 නම් කර එම ආයතන ස්ථාපිත කිරීමේ අරමුණු දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 3 + 2 = 5)

06) i. ශ්‍රී ලාංකික බහු සංස්කෘතික සමාජයේ ඇති මූලික ලක්ෂණ දෙකක් ලියන්න. (ල. 2)
ii. ආර්ථික සංවර්ධනය මන්දගාමී වන විට සමාජ සාධාරණත්වය බිඳ වැටේ. එසේ සමාජ සාධාරණත්වය බිඳ වැටීමට බලපාන කරුණු තුනක් ලියන්න. (ල. 3)
iii. බහු සංස්කෘතික සමාජයක ජනතාව එක්සත්ව කටයුතු කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන තුනක් ලියා ඉන් එකක් ශ්‍රී ලංකාව් සංවර්ධන ඉලක්ක ජයගැනීමට දායක කරගත හැකි ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. ඩි. 3 + 2 = 5)

07) i. මූලික මිනිස් අවශ්‍යතා දෙකක් නම් කරන්න. (ල. 2)
ii. ඕනෑම රටක දකින්නට ඇති මූලික ආර්ථික ප්‍රශ්න 03 අනුපිළිවෙලින් ලියන්න. (ල. 3)
iii. රටක ආර්ථිකයක සිදුවන ප්‍රධාන ක්‍රියාවලීන් තුන නම් කර ඉන් දෙකක් පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ල. 3 + 2 = 5)

# LOL.lk BookStore



## විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න



| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර | A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් | School Book | ගුරු අත්පොත්

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**